# රදගුරුවරුන්ගේ භූමිකාව (DECREE CONCERNING THE PASTORAL OFFICE OF BISHOPS IN THE CHURCH - *CHRISTUS DOMINUS*) පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා නියෝගයː ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්

එච්. අයි. එන්. තත්සරණි ලුසේනා

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

**සභාව තුළ රදගුරුවරුන්ගේ භූමිකාව යන මෙම නියෝගය** 1965 ඔක්තෝම්බර් මස 28 වන දින දෙවන වතිකාන කතිකාවත මගින් ප්‍රකාශයට පත් කරන ලදි. මුල් සභාවේ ප්‍රධාන සේවාවක් වූ රදගුරුවරයේ නූතන භූමිකාව පිළිබඳ තීරණාත්මක ලේඛනය වාද විවාද මධ්‍යයේ සකස්වුණු ආකාරය විමසීම උක්ත අධ්‍යයනයේ මූලික අරමුණ යි.

මෙහි මුඛ්‍ය පර්යේෂණ ගැටලුව වන්නේ පාප්තුමා හා රදගුරුවරුන් අතර පවතින සම්බන්ධය, රදගුරුවරුන්ගේ සාමූහිකත්වය සහ එහි ස්වභාවය කෙසේ ද යන්න පිළිබඳ පක්ෂපාතීව කරුණු ඉදිරිපත් කළ අය හා විපක්ෂව කතා කළ අය අතර පැවති වාද විවාදවල ඓතිහාසික හා දේවධාර්මික පදනම විමසීම ය.

මීට අමතරව පර්යේෂණ ගැටලු දෙකක් දැක්විය හැකිය. එනම් දෙවන වතිකාන සභා නිගමනවලට අනුව රදගුරුතෙම සමස්ත සභාවේ ම සේවාවට හිමිකම් කිව යුතු වුව ද වර්තමානයේ රදගුරුතෙම, රදගුරු පදවියකට සීමා කර ඇත්තේ මන්ද යැයි විමසීම ය. එමෙන් ම මධ්‍යකාලීන යුගයේ රදගුරුවරය ඇගයීමකට ලක් කරන අතර ඊට දායක වූ සභා ශ්‍රේෂ්ඨයන් හා කාල් රානර්, එඩ්වඩ් ස්කිලබෙක්ස්, තෙයියාද් ද ෂාඩැන් වැනි දේවධර්ම විශාරදයන්ගේ අදහස් ද මෙහි දී විචාරයට ලක් කෙරේ.

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද නම් ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශන වේ. තවද ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ප්‍රාථමික මූලාශ්‍ර ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි මෙන් ම අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ.

**මූලික පදː** රදගුරුවරුන්, දෙවන වතිකාන මන්ත්‍රණ සභාව, සාමූහිකත්වය